# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2194/29 - 2020 සැප්තැම්බර් මස 22 වැනි අඟහරුවාදා - 2020.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

1. අනුර දිසානායක මැතිතුමා
   ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය

2. එන්.එච්.එම්. චිත්‍රානන්ද මැතිතුමා
   ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

3. ඩී.එම්.එස්. අබේගුණවර්ධන මැතිතුමා
   ලේකම්, නිපුණතා සංවර්ධන,රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

4. මහාචාර්ය සම්පත් අමරතුංග මැතිතුමා
   සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

5. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන්. විජේරත්න මැතිණිය
   උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

6. මහාචාර්ය යූ.බී. දිසානායක මැතිතුමා
   උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

7. මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිතුමා
   වැඩබලන උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය


1A - G 032737 — 380 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

8. මහාචාර්ය ප්‍රසාන්ත එස්. විජේසිංහ මැතිතුමා
වැඩබලන උපකුලපති, කැළණිය විශ්වවිද්‍යාලය

9. මහාචාර්ය කේ.කේ.සී.කේ. පෙරේරා මැතිතුමා
උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය

10. මහාචාර්ය කේ. කන්දසාමි මැතිතුමා
නිසි බලධාරී, යාපනය විශ්වවිද්‍යාලය

11. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.එස්.ඩී. අමරසේන මැතිතුමා
උපකුලපති,රුහුණු විශ්වවිද්‍යාලය

12. මහාචාර්ය එස්.ඒ. අරියදුරෙයි මැතිතුමා
උපකුලපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

13. මහාචාර්ය එෆ්.සී. රේගල් මැතිතුමා
උපකුලපති, නැගෙනහිර විශ්වවිද්‍යාලය

14. මහාචාර්ය එම්.එම්.එම්. නජීම් මැතිතුමා
උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය

15. ආචාර්ය බී.ඒ. කරුණාරත්න මැතිතුමා
උපකුලපති, රජරට විශ්වවිද්‍යාලය

16. මහාචාර්ය අතුල ගුණපාල මැතිතුමා
වැඩබලන උපකුලපති, සබරගමුව විශ්වවිද්‍යාලය

17. ආචාර්ය සංජීව බෝවත්ත මැතිතුමා
වැඩබලන උපකුලපති, වයඹ විශ්වවිද්‍යාලය

18. ආචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා
වැඩබලන උපකුලපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

19. මහාචාර්ය ඩබ්.එම්. අබේරත්න බණ්ඩාර මැතිතුමා
නිසි බලධාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

20. ගරු මාර්ක් බිලිමෝරා පියතුමා
විදුහල්පති, ශාන්ත තෝමස් විද්‍යාලය, ගල්කිස්ස

21. ගරු ඇලෙක්සැන්ඩ්‍රා මෙන්ඩිස් කන්‍යා සොයුරිය
විදුහල්පති, ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමය, කොළඹ 07

22. එස්.එම්. කීර්තිරත්න මැතිතුමා
විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ 10

23. සඳමාලි අවිරුප්පොල මැතිණිය
විදුහල්පතිනිය, විශාඛා විද්‍යාලය, කොළඹ 05

24. ඩබ්.එම්.ඩී.ටී.පී. වනසිංහ මැතිතුමා
විදුහල්පති, ධර්මරාජ විද්‍යාලය, මහනුවර

25. එෆ්. වෙලේගේ මැතිතුමා
විදුහල්පති, රාහුල විද්‍යාලය, මාතර

26. වෛද්‍ය හර්ෂ අලස් මැතිතුමා
    සභාපති, ගේට්වේ පාසල් සමූහය

27. ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

28. බී. සනත් පූජිත මැතිතුමා
    විභාග කොමසාරිස් ජනරාල්

29. පී.එන්. අයිලප්පෙරුම මැතිතුමා
    අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), අධ්‍යාපන අමාත්‍යාංශය

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.03.31 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, 2020 අගෝස්තු මස 05 වැනි දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මා විසින් නව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා යන අමාත්‍යාංශයන් තවදුරටත් නොපවතින අතර, එම අමාත්‍යාංශයන්හි විෂයපථය අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු ඒ යටතේ අළුතින් පිහිටුවා ඇති කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්වවිද්‍යාල යන රාජ්‍ය අමාත්‍යාංශ වෙත වෙන්කර දී ඇති හෙයින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ මෙම රාජ්‍ය අමාත්‍යාංශයන්හි නව ලේකම්වරුන් උක්ත කාර්ය සාධක බලකායේ සාමාජිකයින් ලෙස පත්කළ යුතු බවට මා විසින් අදහස් කරන බැවින් ද,

තවද, ශ්‍රී ජයවර්ධනපුර, කැළණිය, යාපනය සහ වයඹ විශ්වවිද්‍යාල සඳහා වැඩබලන උපකුලපතිවරුන් වෙනුවට උපකුලපතිවරුන් සහ මොරටුව විශ්වවිද්‍යාලය සඳහා නව උපකුලපතිවරයෙකු පත්කර ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත විධානයේ 1, 2, 3, 7, 8, 9, 10 හා 17 යන සාමාජිකයින් වෙනුවට පහත සඳහන් අමාත්‍යාංශ ලේකම්, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ කාර්ය සාධක බලකායේ සාමාජිකයින් ලෙස මෙයින් පත් කරමි.

1. මහාචාර්ය කපිල පෙරේරා මැතිතුමා
   ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

2. කේ.එම්.එස්.ඩී. ජයසේකර මැතිතුමිය
   ලේකම්
   කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය

3. ආචාර්ය එම්. උපාලි සේදර මැතිතුමා
   ලේකම්
   අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

4. එන්.එච්.එම්. චිත්‍රානන්ද මැතිතුමා
   ලේකම්
   නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

5. එස්.එච්. හරිස්චන්ද්‍ර මැතිතුමා
   ලේකම්
   දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්වවිද්‍යාල රාජ්‍ය අමාත්‍යාංශය

6. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මැතිතුමා
   උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

7. මහාචාර්ය එන්. ආර්. ද සිල්වා මැතිතුමිය
   උපකුලපති, කැළණිය විශ්වවිද්‍යාලය

8. මහාචාර්ය එන්. ඩී. ගුණවර්ධන මැතිතුමා
   උපකුලපති, මොරටුව විශ්වවිද්‍යාලය

9. මහාචාර්ය එස්. ශ්‍රීසත්කුණරාජා මැතිතුමා
   උපකුලපති, යාපනය විශ්වවිද්‍යාලය

10. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ. එම්. යූ. කේ. ජයසිංහ මැතිතුමා
    උපකුලපති, වයඹ විශ්වවිද්‍යාලය

තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මැතිතුමා පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙසත්,

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් දීපා ලියනගේ මහත්මිය මෙම කාර්යසාධක බලකායේ ලේකම් ලෙසත් පත් කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ සැප්තැම්බර් මස 22 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.